ප්‍රශ්නය : අවසරයි ස්වාමින්වහන්ස. අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමිපාණන්ගේ ''මිනිසා හදා රට හදමු'' යනුවෙන් දර්ශනයක්, සංකල්පයක් තිබුණා. උන්වහන්සේ නිතර ප්‍රකාශ කළේ රට හැදීමට පෙර මනුෂ්‍යයා හැදිය යුතු බවත්, ගම හැදිය යුතු බවය. ඒ සංකල්ය පිළිබඳ විග්‍රහයක් කළොත්.

පිළිතුර : අපවත් වී වදාළ අපේ ආචාර්‍යයෝත්තම අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමිපාණන්ගේ මුළු සමාජ මෙහෙවර තුළම යම් අරමුණක්, පණිවුඩයක්, පරමාදර්ශයක් තිබුණා. සමාජ මෙහෙවරේදී තේමා පාඨය වශයෙන් නිතර ගෙනහැර දැක්වූයේ ''මිනිසා නොහදා රට හදන්න බැහැ. මිනිසා හදා ගනිමින් රට හදා ගනිමු'' යනුවෙනුයි. උන් වහන්සේ හැම අංශයකින්ම ක්‍රියා කළේ ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීමටයි. මුළු ජීවිත කාලයම කැප කළේත්, ඒ සඳහා උන්වහන්සේ මුල් කර ගත්තේ ත් බුදුරජාණන් වහන්සේගේ දර්ශනයයි. එදා බුදුරජාණන් වහන්සේගේ බුද්ධ කාර්යයත් එයමයි. බුදුරාජණන් වහන්සේ අවුරුදු 45 ක් මුලුල්ලේ කළේ මිනිසාගේ මනස හදන එකයි. උන්වහන්සේගේ අභිප්‍රාය වුයේ කිසිදු දේශ සීමාවක්, පුද්ගල සීමාවක් යන කුල සීමාවක් ආදි කිසිදු දෙයකට යට නොවී, ඒ සියල්ල ඉක්මවා ''සබ්බස්ස ලෝකස්ස සදේවකස්ස'' යනුවෙන් මුළු මහත් සත්ව සන්හතියටම යහපත උදා කිරීමයි. ඒ ආදර්ශය අනුවයි අපේ මහා නාහිමිපාණන් වහන්සේ ක්‍රියා කළේ. මුලින්ම මිනිසා හැදිය යුතුයි. මිනිසා හැදිය යුතුයැයි අදහස් කළේ භෞතික කාය හැදීම නොවෙයි. මිනිසාගේ මනස හැදීමයි. මිනිසාගේ මනස ගොඩනගන්නේ නැතිව වෙන කිසිදු කාර්යයකින් අප බලාපොරොත්තු වන ප්‍රතිඵලය, සංවර්ධනය සාක්ෂාත් කර ගන්න බැහැ. උන්වහන්සේ ඒ කටයුතු මෙහෙයවනු ලැබුවේ මෙය ඉතාම හොඳින් ධාරණය, අධ්‍යයනය කරගෙනයි. අපට ඒ පණිවුඩය තවමත් ඉතිරිව තිබෙනවා. උන්වහන්සේ බලාපොරොත්තු වු මෙහෙවර එයයි. අපේ රටේ ස්වාමින් වහන්සේලාට, නායකයන්ට, සියලුම ජන කොටස් වලට හා පොදුවේ හැම කෙනෙකුටම උන්වහන්සේ කියා සිටියේ මිනිසාගේ මනස නොයෙක් නොයෙක් පැති වලින් දූෂණය වී තිබෙනවා. එසේ මනස දූෂණය වන්නට නොයෙක් හේතු සාධක තිබෙනවා. මන්දපෝෂණය, ආර්ථික ප්‍රශ්න, දේශපාලන ප්‍රශ්න, වෙනත් ජාතික ප්‍රශ්න යන මේ සියල්ලම මෙයට ඒකාබද්ධ වෙනවා. මේ සියල්ල පොදුවේ සමස්ථයක් ලෙස දකින විට මේ මිනිසා හැදීමේ කාර්යාවලියේ තිබෙන වැදගත් කම අවබෝධ කර ගන්න පුළුවන්කම තිබෙන බවයි.

ප්‍රශ්නය : අපේ නායක ස්වාමින්වහන්සේගේ අදහස් බිම් මට්ටමින් ක්‍රියාත්මක වුනේ කොහොමද? කුමන ආකාරයේ වැඩපිළිවෙලක් ද ඒ සඳහා ක්‍රියාත්මක කළේ?

පිළිතුර : පොදුවේ සමාජයට ඒ පණිවුඩය රැගෙන ගියා. උන්වහන්ස් එය ආදර්ශයෙන් හා අවවාදයෙන් කළා. උන්වහන්සේගේ සේවාව ආරම්භ වුයේ ධර්මායතනයත්, වජිරාරාමයත් මුල් කොට ගෙනයි. මෙහි මුලිකව දායක සභාව ලෙස කටයුතු කරන්නේ ශාසන සේවක සමිතිය මුල් කර ගෙන දහම් පාසල, තරුණ ශීල සමාදානය ආදි වශයෙන් අනෙකුත් සියලුම සංයුතියක්ම මෙහෙය වුයේ ඒ කාරණය උදෙසායි.

අපි මිනිස්සුන්ට, සමාජයට යහපත කරන්න අවශ්‍යයි. මිනිස්සුන්ගේ දුප්පත්කම නැති කරන්න අවශ්‍යයි. ශ්‍රමදාන වැඩ, සෞඛ්‍යදාන වැඩ කරන්න අවශ්‍යයි. අසරණ ලෙඩුන්ට සලකන්න අවශ්‍යයි. ඒවගේ කටයුතු වලට උන්වහන්සේ බොහෝ දායක දායිකාවන්ව මෙහෙයවනු ලැබුවා. උන්වහන්සේගේ ශිෂ්‍ය පුත්‍රයන් මෙහෙයවනු ලැබුවා. උන්වහන්සේ ධර්ම දේශනාවක් කළත්, එහි කොටසක් ඒ සඳහා වෙන් කළා. මේ ආකාරයෙන් පොදුවේ උන්වහන්සේ මේ පණිවුඩය සමාජයට රැගෙන ගියා. උන්වහන්සේ කිසිම ආකාරයක කාය විවේකයක්, කයට පහසුවක්, ආත්ම ලාභයක් බලාපොරොත්තුවෙන් ඒ දේවල් කරනු ලැබුවේ.

ප්‍රශ්නය : අපවත් වූ නායක ස්වාමීන්වහන්සේගේ ගමන දෙස බලන විට උන්වහන්සේ අසමාන පුද්ගලයෙක්. උන්වහන්සේ ආරම්භ කළ මේ ගමන දැන් ඉදිරියට ගෙන යන්නේ කෙසේද?

පිළිතුර : ඇත්ත වශයෙන්ම මෙය ඉතාම භාරදූර කාර්යයක්. උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වුයේ එයයි. අපේ පෞරුෂයන් විවිධාකාරයි. ඒ නිසා අපගේ ශක්ති ප්‍රමාණයෙන් එය ඉදිරියට ගෙනියනවා. උන්වහන්සේට හොඳ ශක්තිමත් ශිෂ්‍ය පිරිසක් සිටිනවා. දායක සභාව උන්වහන්සේගේ එම පණිවුඩය තුළ තවමත් සිටිනවා. ඒ නිසා අපි නිරන්තරයෙන්ම කථා කරන්නේ උන්වහන්සේගේ ඒ පරමාර්ථ මුදුන්පත් කරවන්නේ කෙසේද යනුවෙන්. ධර්මායතන දහම් පාසලේ දැනට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6000 ඉක්මවා සිටිනවා. ධර්මායතන දහම් පාසල, ඒවගේම වජිරාරාම දහම් පාසල, තරුණ ශීල සමාදානය, වැඩිහිටි ශීල සමාදානය, ළමා ශීල සමාදානය යන සියල්ලම මූලික වශයෙන් කටයුතු කරන්නේ මේ සඳහායි. ස්වාමීන් වහන්සේලාගේ ධර්ම දූත කාර්යයන්හිදී, යම් යම් අයගේ සාකච්ඡාවලදී අපි ක්‍රියා කරන්නේ, කථා කරන්නේ මේ අරමුණෙන්මයි.

ප්‍රශ්නය : නායක ස්වාමීන්වහන්සේ ධර්ම දූත සේවාව ලොව වටා ගෙන යනු ලැබුවා. අමෙරිකාව, එංගලන්තය වැනි රටවල පවා උන්වහන්සේගේ දර්ශනය දක්නට ලැබෙනවා. ඉදිරියට ඒ අදහස් ක්‍රියාත්මක කරන්නේ කෙසේද?

පිළිතුර : අමෙරිකාවේ මුල්ම ථෙරවාදී පන්සල වොෂින්ටන් බෞද්ධ විහාරයයි. අපේ මහානායක හිමිපාණන් වහන්සේ 1960 දී ලෝක සංචාරයක් කළා. වොෂින්ටන් බෞද්ධ විහාරය ඇති වුණේ ඒ ලෝක සංචාරයේ ප්‍රතිඵලයක් ලෙසයි. දැනට අපට ස්වාමීන්වහන්සේලාගේ අඩුපාඩුවක් තිබෙනවා. ධර්මධරත්වය, ධර්මඥානය, භාෂා ඥානය, ආකල්ප සම්පත්තිය යන මේ සියල්ල ස්වාමීන්වහන්සේලා තුළ තිබීම ධර්ම ප්‍රචාරයට අත්‍යාවශ්‍යයි. නැතිනම් ධර්මදූතයෙකුගේ කාර්යය සඵලත්වය පත් වන්නේ නැහැ. ඒ සඳහා පුහුණුවීම් අපි සිදු කරනවා. ශාඛා ස්ථාන තිබෙනවා. ඒවාත් යම් යම් ආකාරයෙන් මේ සඳහා දායක වෙනවා. ධර්මදූත කටයුතු ශක්ති ප්‍රමාණයෙන් කරගෙන යෑමට උත්සහා කරනවා.

ප්‍රශ්නය : ඔබ වහන්සේ දහම් පාසල පිළිබඳව සඳහන් කළා. රටේ සියලු දෙනාම මෙහි ඇති වැඩ පිළිවෙල පිළිබඳ කතා කරනවා. සමස්ථයක් ලෙස බැලූ විට දහම් පාසල් දර්ශනය මෙයට වඩා ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය නම් ඒ සඳහා සමාජය හා රජය කළ යුත්තේ කුමක්ද?

පිළිතුර : අපි දහම් පාසල් අධ්‍යාපනය ගැන මීට වඩා උනන්දු විය යුතුයි. විශේෂයෙන්ම පවතින සමාජ, ජාතික අර්බුදයට දහම් පාසල හොඳ විසදුමක් ලබා ගත හැකි ස්ථානයක්. ඉතාම වැදගත් පණිවුඩයක් ලබා දිය හැකි ස්ථානයක්. සමාජයේ සහෝදරත්වය, මානව සාධාරණත්වය යන නොයෙක් කාරණා වලදී ඉතාම වැදගත් පාඩමක් කියා දිය හැකි ස්ථානයක්. නමුත් අද දවසේ දහම් පාසලේ අධ්‍යාපන කටයුතු යොමු වී තිබෙන්නේ සම්ප්‍රදායික ක්‍රමයකට. මෙය ඉතාම කණගාටුදායක කරුණක්. සාම්ප්‍රදායක ක්‍රමයක් යනුවෙන් අදහස් කරන්නේ විෂය බද්ධ කරුණු සම්බන්ධයෙන් පමණක් වීමයි. ධර්මඥානය ලබා දීම සඳහා මිස ආකල්ප පැත්තෙන් වෙනස් කිරීමක් බලාපොරොත්තු වන ආකාරයෙන් දහම් පාසල් ඉගෙනීම සිදු වන්නේ නැහැ. අපි පැමිණිය යුත්තේ එතැනටයි. දැනුම අවශ්‍ය කරනවා. නමුත් එයට වඩා ළමයින්ගේ මනස හැදීම, ආකල්ප සම්පත්තිය, බිහි කිරීම වැදගත් සමාජයේ පොදුවේ එතැනටයි කටයුතු කළ යුත්තේ කෙසේද, අන් අය පිළිබඳ කල්පනා කළයුත්තේ කෙසේද යන ආකල්ප සාමාන්‍ය පාසල් අධ්‍යාපනයේ සිට ආරම්භ කළ යුතුයි. මහරගම සිරි වජිරඥාණ දහම් පාසල ඒ කටයුත්ත ශක්ති ප්‍රමාණයෙන් සිදු කරනවා. මහානායක හිමිපාණන් වහන්සේ අපට ප්‍රතිපත්ති පහක් සකස් කර දී තිබෙනවා. මූලික වශයෙන් විනය ඇති කළ යුතුයි. ඒ විනය මුල් කර ගනිමින් ප්‍රතිපත්ති පහ ඔස්සේ දහම් පාසලේ ආචාර්යය මණ්ඩලය දරුවන් හික්මවනු ලබනවා.

ප්‍රශ්නය : පොදු වශයෙන් බැලු විට මෑත ඉතිහාසය තුළ දරුවන්ගේ ආකල්ප වෙනස් වීම හොඳ පැත්තට සිදු වුවා යැයි කියන්න බැහැ. සමාජය තුළ බෙදීම් ඇති වී, නොයෙක් ප්‍රශ්න මතු වුවා මිස අපිට අප බලාපොරොත්තු වු දේ කර ගන්න නොහැකි වුනා. එයට හේතුව කුමක්ද?

පිළිතුර : බුද්ධාගම කියන්නේ නානායතුක වාදයක්. ඒ නිසා මෙයට නොයෙක් හේතු තිබෙනවා. සමාජයේ විනය පිරිහීම, දුප්පත්කම, දේශපාලන වියවුල් ස්වභාව වශයෙන් මේ සියල්ල එයට බලපානවා. ඒ නිසා මානව දයාවෙන්, බොහෝම කාරුණික හැඟීමෙන් ක්‍රියා කළ යුතුයි. අපි ජාතික ගැටළුව දෙස වුවත් බැලිය යුත්තේ එහෙමයි. බුද්ධාගම තුළ දුක පිළිබඳ කතා කරනවා. ජාති, ජාරා, ව්‍යාධි වශයෙන් වන මේ දුක සියලු සත්වයන්ටම පොදු දෙයක්. අපි සියලු දෙනාම මේ දුක තුළ වෙලි සිටිනවා. බුදුරජාණන් වහන්සේම දේශනා කරනවා. මට බෝසත් අවධියේ මේ සත්ත්වයෝ ''කිච්චං වතායන් ලෝකෝ ආපන්නෝ'' යනුවෙන් අදහස් ඇති වුවා යනුවෙන්. මේ සත්ත්වයෝ විශාල අර්බුදයකට, කරදරයකට, පටලැවිල්ලකට මැදි වෙලා සිටින්නේ. සත්ත්වයෝ සංසාරය තුළ මේ ජාරා, ව්‍යාධි, මරණ ආදි වශයෙන් වන මේවාට හසු වෙමින් තමයි ගමන් කරන්නේ. මේ නිසා අපි කුමන ආගමකට, ජාතියකට අයිති වුවත් අපි සියලු දෙනාම එකම දුක ප්‍රවාහයේ ගිලුන අය. ඒ නිසා එකිනෙකා කෙරෙහි කරුණාව ඇතිව කටයුතු කළ යුතුයි. රටක ගිහි

පැවිදි දෙපැත්තේම නායකයන් මුල් වී කල්පනා කරනවානම් අපිට පොදු සම්මුතියක්, අරමුණක් ඔස්සේ මේ සමාජය බොහෝම යහපත් තැනකට ගෙනියන්න පුළුවන් කම ලැබෙනවා.

ප්‍රශ්නය : මේ පරිවර්තනය සිදු විය යුත්තේ කුමන මට්ටමෙන්ද? අපි සිවිල් සමාජය තුළ ආකල්ප වෙනස් කර පසුව එතැනින් ඉදිරියට යා යුතුද? නැතිනම් දේශපාලන මට්ටමෙන් මේ ආකල්ප වෙනස් විය යුතුද?

පිළිතුර : අද හැම දෙයකටම දේශපාලනය මුල් වී තිබෙනවා. ඒ නිසා මුලික වශයෙන් දේශපාලන ප්‍රවාහයෙන් මේ මාවතට පිවිසීමක් අත්‍යාවශ්‍ය වෙනවා. අපි අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ සිට පැමිණි බෙදීම් වලට අනුව, පක්ෂ වලට කොටු වී තවමත් කටයුතු කරනවා. අපි තවමත් පොදුවේ ජාතික කෝණයකින්, චින්තනයකින් බලන්න පුරුදු වී නැහැ. අපි වෙන් වෙන් වශයෙන් කථා කළත්, අවසානයේ ඒකාබද්ධව ඒ පණිවුඩය දියුණු මට්ටමකට ගෙනියන්න ලැබී නැහැ. විශේෂයෙන්ම දේශපාලන නායකයන් එකතු වී මේ විසංවාදි ක්‍රමයෙන් මිදී සුසංවාදි ස්වභාවයකට පැමිණිය යුතුයි. එය කළ යුත්තේ හැබෑම අවංක අදහසින්. තමන්ගේ පක්ෂයේ ජයග්‍රහණය ගැන හෝ තමන් බලයට පැමිණීම ගැන නොහිතා අවංකව කටයුතු කළ යුතුයි. සුසංවාදි හැඟීමෙන්, සංවේදී ස්වභාවයෙන් සියලු දෙනාම කටයුතු කළ යුතුයි. බලයේ සිටින ඇත්තෝ සහ බලය ලබා ගන්න කැමති ඇත්තෝ තවම තරඟ කරන්නේ දෙපිලක සිට. ඒ නිසා සියලු දෙනා එකතු වී, බොහෝම කාරුණික හැඟීමෙන් කටයුතු කිරීම වැදගත්. අපි බලයට එන්නේ කුමක් සඳහාද? අපි බලයට එන්නේ රටට, මහජනතාවට වැඩක්, යහපතක් කරන්න. එය අපේ පිරිසිදු අරමුණ නම් එය සාක්ෂාත් කර ගන්න අපි හැම දෙනාම කටයුතු කළ යුතුයි. එහි බෝධිසත්ව වරයෙක්ගේ ජීවමාන වීම තිබෙනවා. අපි පරාර්ථකාමීව සිතන විට එතැන බුදුවරයෙක් සිටිනවා. එතැන බෝසතාණන් වහන්සේ කෙනෙක් වැඩ සිටිනවා. අපි දේශපලන ව්‍යුහය තුළ ඒ ආකාරයෙන් අපේ ආකල්ප, චින්තනය ඇති කරගත යුතුයි. විශේෂයෙන්ම අලුතින් එන පරම්පරාවට, දේශපාලනයට පිවිසෙන ඇත්තන්ට මේ දැනීම, හැඟීම නැහැ. ඒ නිසා ඒ ඇත්තන්ට මේ ආකල්පය ලබා දීම අත්‍යාවශ්‍යයි.

ප්‍රශ්නය : මේ ආකල්ප වෙනස් කිරීම පටන් ගත යුත්තේ අධ්‍යාපනය තුළින්. දේශපාලන පැත්තෙන් බැලු විට නිතරම සටන් කරන්නේ බලය ලබා ගැනීම සඳහායි. අපි නිදහස ලබා දැන් අවුරුදු 60 ආසන්න කාලයක් වෙනවා. නමුත් තවම අපිට යටත් විජිත යුගයේ තිබූ ආකල්ප වෙනස් කරන්න බැරි වෙලා. තවමත් අපි පවතින්නේ ඒ බෙදීම් හරහා. එකමුතුකම තමයි බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ යථාර්ථය. බුදුන්රජාණන් වහන්සේ කටයුතු කළේ මේ වගේ කුල, පක්ෂ බෙදීම් වලට එරෙහිවයි. නමුත් අවුරුදු 60 ක් තුළ අපිට බැරි වුණා මෙය නිවැරදිව සකස් කරන්න. එයට හේතුව කුමක්ද?

පිළිතුර : සමඟි වීමකින් තොරව මේ ප්‍රශ්න වලින් අපිට ජයග්‍රහණයක් ලබා ගන්න බැහැ. මේ නිසා ''සිංහලයින් සමඟි වන්න'' යනුවෙන් මඩිහේ නායක ස්වාමින්වහන්සේ නිතරම තුන් වතාවක් කියනවා. සිංහල සමඟිය කියන්නේ සිංහලයාගේ පමණක් සමඟිය නොවෙයි. සිංහල සමඟිය ලෙස

කියන්නේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන මේ සියලුම ජාතීන්ගේ සමඟිය බව උන්වහන්සේ නිතර මතක් කර සිටියා. අපි ජාතික සමඟියක්, එක්සත් භාවයක් ගැන කල්පනා කරන්නේ නැහැ. අපි උත්සාහ කරන්නේ වෙන් වෙන් වශයෙන් බලයට පැමිණෙන්න. යම් එක් අරමුණක් වෙනුවෙන් අපි කටයුතු කරන්න, හැදෙන්න අවශ්‍යයි. අද රටේ අපට පොදු පරමාර්ථ නැහැ. සුදු අධිරාජ්‍ය වාදීන් අපිට කළ මේ වින්නැහියේ ප්‍රතිඵල අපි තවමත් කර තියාගෙන යනවා. අපට ඉන් ගොඩ වෙන්න හැකියාවක් නැහැ. අපේ තවම තියෙන්නේ ඒ ඇත්තන් විසින් හඳුන්වා දුන් අධ්‍යාපන ක්‍රමයක්. ඉතිහාසයේ අපේ තිබුණේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමයක්. මිහිඳු හිමියන් ලංකාවට වැඩියාට පසු අපට දේශීය අධ්‍යාපන ක්‍රමයක් තිබුණා. ඒ බෞද්ධ අභාශය ලැබුණ අධ්‍යාපනයයි. විදේශ ආක්‍රමණත් සමඟම ඒ අධ්‍යාපන රටාවෙන් රට බැහැර වුණා. නැවත අප එතැනට පැමිණිය යුතුයි. අපේ දේවල්, අපේ කම නැවත මතු කර ගත යුතුයි. අපේ දේශීය චින්තනයට අප පැමිණිය යුතුයි. ධර්මපාලතුමා, කුමාරතුංග මුණිදාසතුමා හඬ නැගුවේ ඒ පණිවුඩය ලබා දෙන්න. අපි ඒවා පාඩක කර ගනිමින් කටයුතු කළ යුතුයි. අපි විදේශිකයන් පසු පස යන්න අවශ්‍ය නැහැ. ඉතිහාසය, සම්පත්, සම්ප්‍රදාය තිබෙනවා. මේ සියල්ල කැටි කර එකතු වී කුඩා කණ්ඩායමක් ලෙස හෝ විශාල ගමනක්, දියුණුවක් කරා යන්න අවස්ථාව අපට තිබෙනවා.

ප්‍රශ්නය : අද බටහිර ලෝකයේ විදේශිකයන් ධර්මය පිළිබඳ බොහෝ උනන්දු වෙනවා. නමුත් තවම ධර්මයෙන් ප්‍රයෝජන ගන්න අපට නොහැකි වී තිබෙනවා. එය තමයි මෙතන සිදු වී තිබෙන අපරාධය.

පිළිතුර : බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය ලබා දෙනවා කියා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. නමුත් එය නමට පමණයි. ඒ ප්‍රතිපත්තියට මුල් තැනක් ලබා දිය යුතුයි. බුදුරාජණන් වහන්සේගේ ශාසනය කියන්නේ ''පඨිපත්ති සාරකංහි බුද්ධ වචනං''. ප්‍රතිපත්තියම සාරය කොට ගත යුතුයි. එසේ නොමැතිව මෙය පිටස්තරව ආලේප කර ගනිමින් ධර්මයෙන් ලබා ගත යුතු ශාන්තිය අපට ලබා ගන්න බැහැ. අපි මෙය තේරුම් ගත යුතුයි. අපේ ජීවිත බොහෝම කෙටි කාලීනයි. අපි හැමදාම ජීවත් වෙන්නේ නැහැ. ඒ කෙටි කාලය තුළ පූර්ණ කාලීනව සමාජයට අත් දකින්න පුළුවන් අර්ථයක්, දියුණුවක් ඇති වන ආකාරයට අප කටයුතු සිදු කළ යුතුයි.

ප්‍රශ්නය : ඔබවහන්සේ ත්‍රිපිටකට සරල භාෂාව හරවා එය ජනප්‍රිය කිරීම සම්බන්ධයෙන් යම් මඟ පෙන්වීමක් කරනවා. ඒ පිළිබඳ විග්‍රහ කළොත් ස්වාමීන් වහන්ස.

පිළිතුර : 1956 බුද්ධ ජයන්තිය වෙනුවෙන් ත්‍රිපිටකය පරිවර්තනය ආරම්භ කළා. රාජ්‍ය අනුග්‍රහය ඇතිව එය දැන් සම්පූර්ණ කර තිබෙනවා. නමුත් පොදුවේ මහජනතාවට එහි සිංහල පරිවර්තනය තේරුම් ගැනීම අපහසුයි කියන අදහස මත බුද්ධශාසන අමාත්‍යාංශය අලුතින් තීරණය කළා නැවත ත්‍රිපිටකය සරල සිංහලයෙන්ලිවීමට. මෙය ආරම්භ කළේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ අවධියේ. වැලිගම ඤාණරතන මහානායක හිමියන් මුල්කරගෙන ඒ කටයුතු ආරම්භ වුණා. එය බොහෝ සේ සාර්ථක වී තිබෙනවා. දැන් එහි පොත් හතක්, අටක් පමණ

මුද්‍රණයෙන් නිකුත් කර තිබෙනවා. ඉතාම සරල සිංහලයෙන්, සංක්ෂිප්තව සිදු කර තිබෙනවා. ධර්මයට ලැදි, ධර්මය ඉගෙන ගන්න කෙනෙකුට එයින් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන්.

ප්‍රශ්නය : ජාත්‍යන්තර මට්ටමින් බලන විට ධර්මය ගැන ලොකු උනන්දුවක් තිබෙනවා. තොරතුරු තාක්‍ෂණ යුගයේ ආත්මය තිබෙන්නේ ධර්මය තුළ යැයි බොහෝ දෙනෙක් අදහස් කරනවා. මේ අවස්ථාවේ දී අපි එයට ඇතුල් වෙන්නේ කෙසේද?

පිළිතුර : බුදුරජාණන් වහන්සේගේ පණිවුඩය අකාලිකයි. ''සබ්බස්ස ලෝකස්ස සදේව කස්ස'' යනුවෙන් සඳහන් කළා වගේ එය දෙවියන් සහිත සියලු දෙනාටම පොදුයි. එක කොටසකට පමණක් සීමා වී නැහැ. බුද්ධිමතුන්ට එය බොහෝ ප්‍රිය වී තිබෙනවා. බටහිර බොහෝ දෙනා දැන් ධර්මය පිළිබඳ ගවේෂණය කරනවා. බොහෝ පොත්පත් ලියනවා. මේ නිසා ලංකාවේ අප නිවැරදි ධර්මය ඒ ඇත්තන්ට ලබා දෙන්න හැම විටම ක්‍රියා කළ යුතුයි. ඒ අය බුදුරාජණන් වහන්සේගේ ධර්මය ලෙස හඳුනා ගනු ලබන්නේ වෙනත් සාම්ප්‍රදායික මති මතාන්තර. බෞද්ධ වශයෙන් නොයෙක් ආකාරයෙන් ක්‍රියාත්මක වු දේවල් හා නිකාය වශයෙන් ක්‍රියාත්මක වූ පොඩි පොඩි අදහස් තමයි සමහර ඇත්තෝ ග්‍රහණය කර ගනු ලබන්නේ. එයින් තොර නියම බුද්ධ ධර්මය අපිට දෙන්න පුළුවන් නම් එය ශ්‍රී ලංකාව කරනු ලබන විශාල මෙහෙවරක්. මෙතෙක් ලංකාව ඒ කාර්ය භාරය ඉටු කළා. අපේ හාමුදුරුවරුන්ට, බුද්ධිමතුන්ට, රජයට අන්තර්ජාලය වැනි තාක්‍ෂණය භාවිතයෙන් බොහෝ දේ සිදු කළ හැකියි. දැනටමත් විශාල වශයෙන් බටහිර උගතුන්, විශ්ව විද්‍යාල වල මේ පිළිබඳ නොයෙක් පර්යේෂණ පවත්වනවා. නොයෙක් පොත් පත් කිතුක් කර තිබෙනවා.

ප්‍රශ්නය : මෙයට නායකත්වය ලබා දිය යුත්තේ රජයද? ස්වාමින් වහන්සේලාද? සිවිල් සමාජයද?

පිළිතුර : අපි සියලු දෙනාම එකතු විය යුතුයි. අපි පුරුදු වී සිටින්නේ වෙන් වෙන් වශයෙන් සිතන්න. වෙන් වෙන් වශයෙන් නැතිව එකතු විය යුතුයි. සෑම අවස්ථාවකදීම එකතු වී කටයුතු කළ යුතුයි. රට ගොඩනැගීම, ජාතික ප්‍රශ්නය විසඳා ගැනීම, අධ්‍යාපනය ආදි සෑම දෙයකදීම අන්‍යෝන්‍ය වශයෙන් ඒකාබද්ධ ස්වරූපයෙන් කටයුතු කරන්න උත්සාහ කළ යුතුයි.

ප්‍රශ්නය : අපේ සමාජයේ යම් පරිවර්තනයක් කළ යුතුව තිබෙන බව හැම දෙනාම පිළිගනු ලබනවා. නමුත් සියලු දෙනාම කණ්ඩායම් වශයෙන් බෙදී සිටින නිසා සියලු දෙනාම උත්සාහ කරන්නේ තමාගේ ම පටු අරමුණු ඉටු කර ගන්න. ස්වාමින් වහන්සේලාට මේ සඳහා උපදේශයක් ලබා දිය හැක්කේ කෙසේද? අපේ ඉතිහාසය තුළ සමාජය විනාශ වී යන අවස්ථා වලදී නායකත්වය ලබා දෙනු ලැබුවේ අපේ ස්වාමින් වහන්සේලා. නායකයන් හැදුවේ ස්වාමින් වහන්සේලා. එය කළ හැකි වන්නේ කෙසේද?

පිළිතුර : එය ඉතා වැදගත් කාරණයක්. මිහිදු හිමියන්ගේ පැමිණීමේ සිටම මේ රටට නායකත්වය ලබා දෙනු ලැබුවේ ස්වාමින් වහන්සේලා. රජවරු ක්‍රියාත්මක වුයේ ස්වාමින්වහන්සේලාගේ

අනුශාසනා ඔස්සේ. විදේශීය ආක්‍රමණ සමඟ ඒ නායකත්ව දුර්වල වුණා. මිනිස්සු පන්සලෙන් දුරස් වෙන්න පටන් ගත්තා. ගමයි, පන්සලයි අතර සම්බන්ධතාවය ඈත් වුණා. මේ ක්‍රමය අපි නැවත ස්ථාපනය කර ගැනීම අවශ්‍යයි. මේ සඳහා ස්වාමීන් වහන්සේලාගේ පැත්තෙන් බොහෝ දේ සිතිය යුතුයි. අප තවමත් සිතන්නේ යම් යම් පක්ෂය වලට යටත් වෙලා. බුද්ධ මතයට වඩා වෙනස් දේශපාලන මතිමතාන්තර වලට අප අහුවෙලා. බුදුරජාණන්වහන්සේගේ ධර්ම මුල් කර ගෙන කටයුතු කරන විට අපට බොහෝ දේ ලැබෙනවා. නිකාය වශයෙන් කටයුතු කරන්න පහසු වුවත්, පොදු අදහසකදී එකට කටයුතු කරන්න තවමත් සුදානම් නැහැ. සංඝ තලයේ ඒ ආකාරයේ එක්සත් භාවයකට සුදානම් නම් අපට ඇති බොහෝ ප්‍රශ්න විසඳා ගන්න හැකියාව තිබෙනවා.

ප්‍රශ්නය : ඒ සඳහා යම් පියවරක් ගෙන තිබෙනවාද? නැතිනම් සාකච්ඡා කරමින් සිටිනවාද?

පිළිතුර : ඒ පිළිබඳව සාකච්ඡා වෙනවා. යම් අදහස් තිබෙනවා. නමුත් කොයි ආකාරයෙන් හෝ නොපෙනන බලවේගයක් එයට එරෙහිව රට තුළ ක්‍රියාත්මක වෙනවා. නොයෙක් විදේශීය බලවේග රට තුළ ක්‍රියාත්මක වෙනවා. යම් ආකාරයෙන් එකතු වෙන්න උත්සාහ කරන විට ඒ කඩා බිඳ දමන්න උත්සාහ කරන බලවේග තිබෙනවා. අපි ඒවා හඳුනාගෙන සත්භාවයෙන් යුතුව, සෘජු පටිපන්න ආදි ස්වභාවයන් ආරක්ෂා කර ගනිමින් ඉදිරියට ගියහොත් ඒ බලවේග මැඩ පවත්වන්න බොහෝම පහසුයි. එයින් අපේ අරමුණ සාක්ෂාත් කර ගන්න හැකි වෙනවා.

පිළිතුර : තායිලන්තයේ මහා සංඝරත්නය තුළ යම් සමඟියක් තිබෙනවා. අපේ රට තුළ තමයි යම් බෙදීමක් තිබෙන්නේ.

පිළිතුර : තායිලන්තයත් ථෙරවාදි බෞද්ධ රටක්. නමුත් එයට වඩා සමාජ මෙහෙවරක් අපේ රටේ හාමුදුරුවන්ගෙන් සිදු වෙනවා. අඩුම වශයෙන් බණ කියන ක්‍රමයක් වත් තායිලන්තයේ නැහැ. සිල් සමාදන් වෙන ක්‍රමයක් නැහැ. අපේ රටේ භික්ෂූන් වහන්සේලා තුළ සමාජය සමඟ ආබද්ධ වීමේ ස්වභාවයක් තිබෙනවා. සංස්කෘතිය තුළ විශාල දීප්තියක්, අලෝකයක් තිබෙනවා. ආගන්තුකව බලන විට අපිට යම් ස්වභාවයක් පෙනුනට තායිලන්තය ථෙරවාදි රටක් ලෙස හොඳ දියුණුවක් ලබා ගෙන සිටිනවා යැයි කියන්න අමාරුයි. ඒ නිසා තමයි වෙනත් අයට අවස්ථාව ලැබී තිබෙන්නේ. ඒඩ්ස් රෝගය පැතිරීම වැඩියි. ඒ වගේ දේවල් සඳහා ඉඩකඩ ලැබී තිබෙන්නේ බෞද්ධ රාමුවෙන් පිටස්තරව සමාජය ක්‍රියාත්මක වීම නිසයි. අපේ රටේ එහෙම තත්ත්වයක් නැහැ. අපේ රටේ තිබෙන ස්වභාවය තවමත් හොඳයි. අපේ තරුණ පරම්පරාව තවමත් හොඳයි. ඒ දේ අපි තවත් දියුණු කර මුළු රටම දියුණුවට පත් කර ගන්න අපි උත්සාහ කරන්න අවශ්‍යයි.

ප්‍රශ්නය : ගෝලීයකරණය ඇතුළු වන විට තමාගේ සංස්කෘතිය, අනන්‍යතාවය අමතක වන විට ප්‍රශ්න මතු වෙනවා. තායිලන්තයත් මුහුණ දී තිබෙන අභියෝගය එයයි. එකවිටම ගෝලීයකරණයට ඇතුළු වන විට නොයෙක් අදහස් සමාජය එනවා. එවිට තමාගේ අනන්‍යතාවය මුළුමනින්ම විනාශ වෙනවා. එයින් සමාජයක් වැටෙන්නත් ඉඩ තිබෙනවා. අපටත් ඒ අභියෝගයට මුහුණ දෙන්න සිදු

වෙලා. මෙයට  තායිලන්තයෙන් අත්දැකීමක් ලබා ගන්න හැකියාව තිබෙනවා. එයට අපි මුහුණ දෙන්නේ කොහොමද?

පිළිතුර : අපට නොයෙක් පාඩම් ඉගෙන ගන්න අවස්ථාව තිබෙනවා. එයින් ආදර්ශ ගෙන අපේ රාමුව තුළ සිට අපේ සීමාවල් වලට අනුකූල වන ආකාරයට සියල්ල සකස් කර ගත යුතුයි. අපට ජාත්‍යන්තර මට්ටම මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන්න හැකියාවක් නැහැ. රටක් දියුණු කරන්න ජාත්‍යන්තර සම්බන්ධතා අත්‍යාවශ්‍ය වෙනවා. අධ්‍යාපන, සෞඛ්‍ය අංශ වුවත් එහෙමයි. ''මගේ ගෙදරට පිටින් හුළඟට ඇතුළු වෙන්න දොර කවුළු ඇරිනවා. නමුත් මේ ගේ අරගෙන යන්න දෙන්නේ නැහැ.'' කියලා මහත්මා ගාන්ධිතුමා ප්‍රකාශ කළා. මෙම ප්‍රතිපත්තියම කුමාරතුංග පඬිතුමා තුළත් තිබුණා. අපේ කම, දේශීයත්වය මුලික වශයෙන් ආරක්ෂා කරගෙන අපේ අනන්‍යතාවය රැකෙන ආකාරයෙන් බාහිර දේවල් ඇතුළු කර ගන්න අවශ්‍යයි. ඒ නිසා අවධානය, පරිස්සම ඇතිව අවබෝධයකින් යුතුව ඒවාට අත තියන්න පුළුවන්. එවිට අපේ කමත් ආරක්ෂා වෙනවා. බාහිර දේවල් අපට අනුකූල ආකාරයෙන් සම්බන්ධ වීම නිසා අපේ දේ රැකගෙන යන්න අවස්ථාවත් තිබෙනවා.

ප්‍රශ්නය : අපි අපේ ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය අපි අගය කරනවා. නමුත් එයත් බටහිර ලෝකයෙන් අපට ලැබුණු දෙයක්. අපි එහි යථාර්ථය තවමත් අපි අවබෝධ කරගෙන නැහැ. විපක්ෂයේ කාර්ය භාරය රජය කියන හැම එකම ප්‍රතික්ෂේප කරන එක නොවෙයි. ජාතික ප්‍රශ්න වලදී සමගියෙන් කටයුතු කරනවා. අනෙක් අවස්ථාවලදී රජය හා විපක්ෂය වෙනම කටයුතු කිරීම ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා අපි අපේම කියා ක්‍රමයක් බිහි කිරීම වැදගත්ද?

පිළිතුර : ඇත්ත වශයෙන්ම එය අද ඉතා අත්‍යාවශ්‍ය දෙයක්. අපට තිබෙන්නේ බ්‍රිතාන්‍ය සම්ප්‍රදායට අනුව හැඩ ගැසුනු පාර්ලිමේන්තුවක්. ලිච්චවී රාජ්‍ය සම්ප්‍රදාය අපට තිබෙනවා. බුදුරජාණන් වහන්සේගේ දේශනාවල එය පිළිගෙන තිබෙනවා. ඒ නිසා තවදුරටත් නිතරම විපක්ෂය විරුද්ධ පක්ෂය ලෙස සිටින්නේ නැතිව අවශ්‍ය තැන් වල එකමුතුව ක්‍රියා කරන්න අවශ්‍යයි. ජාතික ප්‍රශ්නයේදී වුවත් අපි තවමත් දෙපැත්තකට වෙලා සිටිනවා. එකතු වෙන්න අදහසක් නැහැ. බ්‍රිතාන්‍යයේ වෙන් වී කටයුතු කළ පක්ෂය දෙක දෙවන ලෝක යුද්ධ සමයේ දී එකතු වී කටයුතු කළා. අපි ඒවාගේම බැරෑරුම් අවස්ථාවකට අද මුහුණ දී තිබෙනවා. නමුත් තවමත් අපිට අපේ ප්‍රධාන පක්ෂ දෙක එකතු වී මේ ප්‍රශ්නට විසඳ ගන්න බැරි වී තිබෙනවා.

ප්‍රශ්නය : මට පෙනෙන ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ කුමක්ද කියා අපි තවමත් අවබෝධ කර ගෙන නැහැ. බ්‍රිතාන්‍යයේ තිබුණු දේ මතුපිටින් පමණක් ගෙන අපි ක්‍රියාත්මක වෙනවා.

පිළිතුර : අපි දේශපාලනය කරන්නේ කුමක් සඳහාද? ප්‍රජාතන්ත්‍රවාදයක් අවශ්‍ය කුමක් සඳහාද? කියා හැඟීමක් නැහැ. අපේ අරමුණ විය යුත්තේ පොදුවේ සමාජය යහපයක් කිරීම. සමාජය අපි ජය ගන්න අවශ්‍ය නම්, මිනිසුන්ගේ දුප්පත්කම නැති කරන්න අවශ්‍ය නම්, වාගේ පොදු සත්භාවයක්

අපිට තිබෙනවානම් මේවා අපිට ලොකු ප්‍රශ්න නෙවෙයි. අපිට බොහෝ පහසුවෙන් මේවා තේරුම් ගන්න අවස්ථාව තිබෙනවා. ඒ චින්තනයෙන් ඈත්ව ආත්මාර්ථකාමය, බල තණ්හාව යන සාධක වලින් යුතුව හිතන නිසා තමයි අපි බලාපොරොත්තු වන ශාන්ති මාර්ගයට තවමත් එන්න නොහැකි.

ප්‍රශ්නය : අවසාන වශයෙන් ඔබ වහන්සේට එක උපදෙසක් තිබෙනවානම් අපේ සමාජයට දෙන්න එය කුමක්ද?

පිළිතුර : අපි ගිහි පැවිදි සියලු දෙනා එකතු වී අපේ පෞද්ගලික න්‍යාය පත්‍ර සියල්ලෙන් ඉවත් වී පොදු පරමාර්ථ, පොදු ප්‍රශ්නය වෙනුවෙන් එක්සත් වෙමු. එක්සත් ශ්‍රී ලංකාවක් හදා ගනිමු. එවිට සියලු අවුල් වියවුල් වලින් අපිට බැහැර වෙන්න අවස්ථාව ලැබෙනවා. එවිට විරුද්ධව සිටින ජනකොටස් ද එකතු කරගෙන අපේ රට ධර්මද්වීපයක් බවට පත් කර ගන්න අපිට ශක්තිය ලැබෙනවා. එක්සත් වූ ජාතික චින්තනයකින් සන්නද්ධ ව ඉදිරියට යෑමට අධිෂ්ඨාන කර ගනිමු.

බොහෝම ස්තූතියි ස්වාමින් වහන්ස.